# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,691 — 1959 මාර්තු 6 වැනි සිකුරාදා—6.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටුඅංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — | රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | 703 | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 705 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 703 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 703 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 706 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 705 | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959 අංක 91**

අංකය : ඩී.13/රෙක්ට්.

**රාජකීය ලංකා ගුවන් හමුදව—කොමිෂන් බලපත්‍ර ලත් ධූරවලට පත්කිරීම්**

1959 පෙබරවාරි මස 7 වැනි දින සිට අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පහත සඳහන් කරනලද මහත්වරුන්, රාජකීය ලංකා ගුවන් හමුදුවේ නියමු නිළධාරීන් වශයෙන් කොමිෂන් බලපත්‍ර ලත් ධූරවලට පත් කොට, ඔවුන් පොදු රාජකාරි ශාඛාවට ඇතුළත් කොට තිබේ.

නම

රොනල්ඩ් කොල්මන් ෆ්‍රෙඩ්රික් මාර්ෂල්

නොඑල් හැරල්ඩ් ලොකුගේ

නූර් රහිම රහිම්

ඔස්මන්ඩ් මුතුනායගම් පෝල්

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

කොළඹ 1,
1959 පෙබරවාරි මස 26 දින.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 92**

අංකය : ජී. 5/56.

1959 ජනවාරි මස 13 වැනි දින සිට තාවකාලික සහකාර පොලිස් සුපිරින්ටැන්ඩන්ට් පී. ආර්. ද ඇස්. සෙනෙවිරත්න මහතා තාවකාලික පොලිස් සුපිරින්ටැන්ඩන්ට් කෙනෙකු වශයෙන්.

ආර්. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1959යේ මාර්තු මස 3 වැනි දින,
කොළඹ 1. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500,

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම්

**1959 අංක 93**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේඑජී 2/48.

එස්. ආර්. විජයතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1959 මාර්තු 2 වැනි දින, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 6,891 නඩුවේ තීන්දුව දීමට, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නාඩුකාර ධූරයට.

# වෙනත් පත් කිරීම්

**1959 අංක 94**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/80(එම්එෆ්).

පී. බී. මුදන්නායක මහතා 1959 පෙබරවාරි මස 16 වෙනි දින පටන් මහනුවර කච්චේරියේ සේවයෙහි යෙදීමට.

ඊ. එච්. සෙනෙවිරත්න මහතා 1959 පෙබරවාරි මස 16 වෙනි දින පටන් මහනුවර පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්‍යාල සහකාර වශයෙන්.

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1959 මාර්තු මස 2 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1.

---

**1959 අංක 95**

අංකය : ඒඕ/1958.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 1947 සැප්තැම්බර් මස 18 වෙනි දින අග්‍රාණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ නිවේදනයකින් සංශෝධනය කරන ලද 372 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්, එම සිවිල් නඩු විධාන සංග්‍රහයේ 371 වෙනි වගන්තියේ සඳහන් දිවුරුම් සහතික කිරීම පිණිස බලපිටියේ නියෝජ්‍ය පිස්කල්තැනගේ කාර්‍යාලයේ ලිපිකරු ඩී. ඇම්. වූලරත්න මහතා එම ධුරය දරණ කාලය තුල බලපිටියේ අධිකරණ කොට්ඨාශයට විශෙෂ නිලධාරියෙක් වශයෙන් පත්කර ඇත්තේය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡෙදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1959 පෙබරවාරි මස 18 වෙනි දින සිට කේ. නල්ලෙයිනාදන් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ සමන්තුරේ පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ජේ. එම්. සහාරත්නම් මහතාද,

1959 පෙබරවාරි මස 24 වෙනි දින සිට පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තුවේ සහ කඩවත්ති අන්ඩිමුනෙයි ග්‍රාම කොට්ඨාශය ඇතුළු උඩප්පු ග්‍රාම කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයට එම්. රාජලිංගම් මහතාද

පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1959, මාර්තු මස 3 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

---

**1959 අංක 96**

ඉන්ද්‍රානි දමයන්ති සේනාරත්න මහත්මිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශකටයුතු පිළිබඳ අමාත්‍යශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දීය.

---

**1959 අංක 97**

ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් පඩුවාවල චාර්ලිස් පෙරේරා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දීය.

---

**1959 අංක 98**

දෙන් අසෝක තිලකරත්න මහතා කැකිරාවේ ව්‍යාපාරස්ථානය සහ කාර්‍යාලය ද එප්පාවල අතුරු කාර්‍යාලයද ඇතුව අනුරාධපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශකටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 13 වැනි දින
කොළඹ දීය.

---

# ආණ්ඩුවේ නිවේදන

අංකය : ඕ. ඇම්. 4/1/11 ඇෆ්(11).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම දනුම් දී ඇති දිනයේ සිට බල පැවැත්වේ :—

1959 ජනවාරි මස 3 වැනි දින සිට නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ පස්වැනි පෙලේ ඇන්. බාලසුබ්‍රමනියම් මහතා, නවදිල්ලියේ ලංකා මහ කොමසාරිස් කාර්‍යාලයේ (විදේශ සේවයේ පස් වැනි පෙලේ) දෙවැනි ලේකම් වශයෙන්

ජී. ද සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු බාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ 1, උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලේදීය.

අංකය : ඕ. ඇම්. 4/1/11 ඇෆ් (2).

ලංකා විදේශ සේවයේ පහත සඳහන් මාරු කිරීම් දනුම් දී ඇති දිනයේ සිට බල පැවැත්වේ :—

1959 ජනවාරි මස 23 වැනි දින සිට, නැවත නියම කරන තුරු, ලංකා විදේශ සේවයේ පස් වැනි පෙලේ කේ. මානික්කලින්ගම් මහතා කැන්බරාහි ලංකා මහ කොමසාරිස් කාර්‍යාලයෙන් සේවය සඳහා.

ජී. ද. සොයිසා,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු බාර අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1959 පෙබරවාරි මස 24 දින,
කොළඹ 1, උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලේදීය.

---

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

1959 මාර්තු මස 2 වැනි දින,
කොළඹදීය.

සී. පී. ආර්. ගුණවර්ධන,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

## උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | නියෝගය පළකළ ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1958.10.17 | මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය (අර්තාපල්) | 58.10.22 දින, අංක 11,561 |
| 1958.10.20 | කළුතර දිස්ත්‍රික්කයේ මිළ (ආහාර) පාලක | එම | 59.10.22 දින, අංක 11,561 |
| 1958.10.20 | රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.10.22 දින, අංක 11,561 |
| 1958.10.17 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | එම | 58.10.22 දින, අංක 11,561 |
| 1958.10.18 | පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කයන්හි මිළ (ආහාර) පාලක | එම | 58.10.22 දින, අංක 11,561 |
| 1958.11. 3 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | එම | 58.11. 7 දින, අංක 11,580 |
| 1958.12. 5 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක | කරවල සහ වියලි ඉස්සෝ | 58.12.10 දින, අංක 11,612 |
| 1958.12. 6 | ගාලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.10 දින, අංක 11,612 |
| 1958.12. 3 | මාතලේ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.12 දින, අංක 11,615 |
| 1958.12. 5 | පුත්තලම සහ හලාවත දිස්ත්‍රික්කයන්හි සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.10 දින, අංක 11,612 |
| 1958.12. 6 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.10 දින, අංක 11,612 |
| 1958.12.27 | රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහර) පාලක | එම | 59. 1. 2 දින, අංක 11,634 |
| 1958.12. 9 | වව්නියා දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අතිරේක ආහාර ද්‍රව්‍ය (අර්තාපල්) | 58.12.16 දින, අංක 11,617 |
| 1958.12. 8 | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | කරවල සහ වියලි ඉස්සෝ | 58.12.10 දින, අංක 11,612 |
| 1958.12. 6 | කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහර) පාලක | එම | 58.12.16 දින, අංක 11,617 |
| 1958.12. 9 | මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | එම | 58.12.16 දින, අංක 11,617 |
| 1958.12.13 | කෑගලු දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.16 දින, අංක 11,617 |
| 1958.12.19 | වව්නියා දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | එම | 58.12.29 දින, අංක 11,630 |
| 1958.12.20 | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12.29 දින, අංක 11,630 |
| 1958.11. 8 | බදුල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | අර්තාපල් | 58.11.14 දින, අංක 11,585 |
| 1958.12.13 | කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එළුමස් සහ හරක් මස් | 58.12.16 දින, අංක 11,617 |
| 1959. 1. 9 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | කරවල සහ වියලි ඉස්සෝ | 59. 1.12 දින, අංක 11,639 |
| 1958.12. 5 | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එම | 58.12. 6 දින, අංක 11,610 |

---

### සමිති, සමාගම් ආඥාපනත (105 වැනි පරිච්ඡේදය)

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් රිචඩ් ගෝඨාභය සේනානායක වන මම, අංක 9,773 හා 1947 සැප්තැම්බර් 24 වැනි දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති ප්‍රකාශයෙන් මඳක් වෙනස් කර ඇති සමිති සමාගම් ආඥාපනතේ (105 වැනි පරිච්ඡේදය) 3 (බී) දරණ වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර, '' සීමාසහිත මුරුතව ශ්‍රී බුද්ධ ජයන්ති සමිතිය '' නමින් පිහිටුවා ඇති සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව, අංක 10,703 හා 1954 අගෝස්තු 13 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන්, සමිති, සමාගම් ආඥාපනතේ (105 වැනි පරිච්ඡේදය) බලතල හා පහසුකම් හිමිකම් ඇති අභිප්‍රාවක් බව මෙම නිවේදනයෙන් අනුමත කරමි.

ආර්. ජී. සේනානායක,
වාණිජ හා වෙළඳ ඇමති.

1959 මාර්තු 2 වැනිද,
කොළඹදීය.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

#### බර අනුව සහල් විකිණීම

1952 ආහාර පාලන රෙගුලාසිවල '' ඊ '' ශීර්ෂයේ II වෙනි කොටසේ 5 වෙනි රෙගුලාසිය සහ '' ඊ '' ශීර්ෂයේ III වෙනි කොටසේ 4 (1) දරණ රෙගුලාසිය අනුව, 1959 මාර්තු 9 වෙනි දින සිට, සලාක ක්‍රමය බලපවත්වන මාතර දිස්ත්‍රික්කය තුළ පදිංචි, මීට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසියම් පංතියකට අයත් සලාක පොතක් හිමි කෙනෙකුට සතියකට බර අනුව විකිණිය යුතු හෝ නිකුත් කළ යුතු හාල් සලාකය එම උපලේඛනයේ එක එක පංතිය ඉදිරියෙන් 2 වෙනි තීරයේ සඳහන් කොට ඇති සහල් ප්‍රමාණය බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| 1 වෙනි තීරය<br>පංතිය | 2 වෙනි තීරය<br>හාල්<br>(රාත්තල් වලින්) |
|---|---|
| ළදරුවා | 4 |
| ළමයා | 4 |
| සාමාන්‍ය | 4 |
| කම්කරුවා | 4 |

**සැළකිය යුතුයි.**—හාල් සේරු 1ක් රාත්තල් 2කට සමානවේ. කූපන් දුන් විට පාරිභෝගිකයින්ට සලාක පොතක් සඳහා සතියකට හාල් සේරු 2ක් වෙනුවට මේ අනුව රාත්තල් හතරක් වශයෙන් හාල් ලැබෙනවා ඇත.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර පාලක සහ ආහාර කොමසාරිස්.

1959 මාර්තු 2 දින,
කොළඹ දීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශොධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයක් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතුරට පැමිණෙන සෑම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දයක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දයක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දයක මුදල ... ... .. | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... .. | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ, රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන්** ඉල්ලුම් කළ යුතුයි.

**ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.**